# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක: **03/2016**

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2016 පෙබරවාරි මස 5 වැනිදා

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>අධ්‍යක්ෂ / නේවාසිකාගාර යන තනතුරු නාමය 'අධ්‍යක්ෂ / ශිෂ්‍ය නේවාසික පහසුකම්' ලෙස නැවත නම් කිරීම</u>**

2011.03.10 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 948 හි සඳහන් අධ්‍යක්ෂ / නේවාසිකාගාර තනතුර සඳහා වූ බඳවා ගැනීමේ පරිපාටිය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

2. 2015.12.03 දින පැවැති සිය 930වන සභා වාරයේ දී කොමිෂන් සභාව විසින්, අධ්‍යක්ෂ / නේවාසිකාගාර යන තනතුරු නාමය **අධ්‍යක්ෂ / ශිෂ්‍ය නේවාසික පහසුකම්** ලෙස නැවත නම් කිරීමට තීරණය කර ඇත.

3. ඒ අනුව, නව තනතුරු නාමය ඇතුළත් බඳවා ගැනීමේ පරිපාටිය ඇමුණුම 1 මඟින් නැවත ඉදිරිපත් කර ඇත.

4. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

**අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා**
**සභාපති**

පිටපත්:
1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

යූජීසී/එච්ආර්/2/3/210 (i) ඊ

ඇමුණුම I

## අධ්‍යක්ෂ / ශිෂ්‍ය නේවාසික පහසුකම් තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටිය

| තනතුර | බඳවා ගැනීමේ ක්‍රමය | සුදුසුකම් |
|---|---|---|
| අධ්‍යක්ෂ / ශිෂ්‍ය නේවාසික පහසුකම්<br><br>යූ-ඊඑක්ස් 2 ( ඒ)<br>U-EX 2 (a) | උසස් කිරීම මගින්<br><br>පළමු අවස්ථාවේදී සළකනු ලබන උසස් අධ්‍යාපන ආයතනය ඇතුළත පළ කරනු ලබන දැන්වීමක් මගින්. සළකනු ලබන උසස් අධ්‍යාපන ආයතනය තුළ සුදුසු අයදුම්කරුවන් නොමැති නම්, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අභ්‍යන්තර දැන්වීමක් පළ කර බඳවා ගැනීම<br><br>තෝරා ගැනීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කෙරේ.ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී 40%ට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ගැනීමට සළකා බැලීම සඳහා හිමිකම් ලබයි. | කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක /ආයතනයක උප-ශාලාධිපති (විශේෂ ශ්‍රේණිය) තනතුරක් දැරීම සහ සහ එම තනතුරේ ස්ථිර කර තිබීම සමඟ පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් වසරකට නොඅඩු පශ්චාත් උපාධියක් ලබා තිබීම සහ කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක /ආයතනයක එම තනතුරේ වසර තුනක (03)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br><br>හෝ<br><br>උප-ශාලාධිපති තනතුරක් දැරීම සමඟ කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක /ආයතනයක එම තනතුරේ වසර විස්සක (20) සතුටුදායක සේවා කාලයක් තිබීම සහ තනතුරේ ස්ථිර කර තිබීම සමඟ පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් වසරකට නොඅඩු පශ්චාත් උපාධියක් ලබා තිබීම |